# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 68 දරන
# පොහොර විධිමත් කිරීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ *II* වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

**මිළ : රු. 1.20 යි.** **තැපැල් ගාස්තුව : ශත 75 යි.**

# 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

**එල්. ඩී.—ඕ. 31/86**

**පොහොර ආනයනය, නිෂ්පාදනය, සකස් කිරීම හා බෙදාහැරීම විධිමත් කිරීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.*

**1.** මේ පනත 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු “නියමිත දිනය” යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

*පොහොර ආනයනය, නිෂ්පාදනය හා සකස් කිරීම සඳහා බලපත්‍ර ලබාගත යුතු බව.*

**2.** (1) නියමිත දිනයෙන් මාස තුනක් ඉකුත්වීමෙන් පසුව, (මෙහි මින් මතු “අධ්‍යක්ෂවරයා” යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ හැර සහ එහි නියමයන්ට හා කොන්දේසිවලට අනුකූල ආකාරයකින් මිස, කිසිම තැනැත්තකු විසින්, පොහොර ආනයනය නිෂ්පාදනය හෝ සකස් කිරීම කරනු නොලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති ඒ ඒ නියමයන්ට සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

*පොහොර උපදේශක කමිටුව.*

**3.** (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පොහොර උපදේශක කමිටුවක් විය යුතුය.

(2) පනතේ පරිපාලනයට අදාළව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පොහොර උපදේශක කමිටුව වෙත කලින් කල යොමු කරනු ලබන යම් කාරණා සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාට උපදෙස් දීම ඒ කමිටුවේ කාර්යය විය යුතු ය.

*නිලධරයන් හා සේවකයන් පත් කිරීම.*

**4.** මේ පනත පරිපාලනය කිරීමෙහි ලා අවශ්‍ය යයි සලකනු ලබන නිලධරයන් හා සේවකයන් යම් සංඛ්‍යාවක් නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබිය හැකි ය.

*අධ්‍යක්ෂවරයාගේ බලතල පැවරීම.*

**5.** (1) අධ්‍යක්ෂවරයා විසින් මේ පනත යටතේ වූ ස්වකීය බලතල අතුරෙන් කිසිවක්, 4 වන වගන්තිය යටතේ පත් කරන ලද යම් නිලධරයකු හෝ සේවකයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයාගේ බලතල අතුරෙන් කිසිවක් පවරන ලද්දේ යම් නිලධරයකු හෝ සේවකයකු වෙත ද, ඒ නිලධරයා හෝ සේවකයා විසින්, එසේ පවරන ලද ඒ බලතල අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

බලපත්‍රය ලබාගැනීම සඳහා ඉල්ලීම.

6. (1) පොහොර ආනයනය, නිෂ්පාදනය හෝ සකස් කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම පිණිස වූ සෑම ඉල්ලීමක්ම නියමිත ආකෘතියෙහි නියමිත ගාස්තුව සමග අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට, අධ්‍යක්ෂවරයා විසින් ඒ ඉල්ලුම්කරුට බලපත්‍රයක් දීම හෝ ඔහු විසින් සටහන් කරනු ලැබිය යුතු හේතූන් මත බලපත්‍රයක් දීම ප්‍රතික්ෂේප කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

බලපත්‍රයේ ආකෘතිය සහ පවත්නා කාලය.

7. මේ පනත යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම—

(අ) නියමිත ආකෘතියෙහි විය යුතු ය; තවද

(ආ) එය කලින් අවලංගු කරනු ලැබුවේ නම් මිස, එය නිකුත් කරනු ලැබූ දින සිට මාස දොළහක කාලයක් සඳහා බලාත්මක විය යුතු ය.

බලපත්‍රය අලුත් කිරීම.

8. (අ) මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග කිසිවක් බලපත්‍රලාභියා විසින් පිළිපැද ඇති බවට සහ මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග කිසිවක් යටතේ වූ යම් වරදකට බලපත්‍රලාභියා වරදකරු කරනු ලැබ නොමැති බවට අධ්‍යක්ෂවරයා සෑහීමට පත්ව ඇත්නම්; සහ

(ආ) බලපත්‍රය අලුත් කිරීම සඳහා නියමිත ගාස්තුව බලපත්‍රලාභියා විසින් ගෙවනු ලබන්නේ නම්

බලපත්‍රය ඉකුත්වීමට පෙර දින තිහකට නොඅඩුව අධ්‍යක්ෂවරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත, වරකට එක් වර්ෂයක් නොඉක්මවන කාල සීමාවක් හෝ කාලසීමාවන් සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලපත්‍රයක් අලුත් කරනු ලැබිය හැකි ය.

බලපත්‍රය අවලංගු කිරීම.

9. (1) බලපත්‍රලාභියා -

(i) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන අතුරෙන් යම් විධිවිධානයක් හෝ ඒ බලපත්‍රයට සම්බන්ධ කොන්දේසි හෝ නියම කිසිවක් කඩකර ඇති බවට; හෝ

(ii) මේ පනත යටතේ වරදකට වරදකරු කරනු ලැබ ඇති බවට, අධ්‍යක්ෂවරයා සෑහීමකට පත්වුවහොත්, මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් ඔහු විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂවරයාගේ තීරණයට විරුද්ධව අභියාචනය කිරීම සඳහා වූ කාලය ඉකුත්වන තෙක් හෝ ඒ කාලය ඇතුළත අභියාචනයක් කරනු ලැබ ඇත්නම් ඒ අභියාචනය ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත්නම් මිස සහ ප්‍රතික්ෂේප කරනු ලබන තෙක් (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම බලාත්මක නොවිය යුතු ය.

අධ්‍යක්‍ෂවරයා විසින් ස්වකීය තීරණය, ඒ සඳහා වූ හේතු ද සමග ඉල්ලුම්කරුට හෝ බලපත්‍රලාභියාට දැනුම් දෙනු ලැබිය යුතු බව.

**10.** (1) බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ බලපත්‍රයක් අවලංගු කිරීමට අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් ස්වකීය තීරණය ඒ සඳහා වූ හේතු ද සමග අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරුට හෝ බලපත්‍රලාභියාට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ යම් ඉල්ලුම්කරුවකුට හෝ බලපත්‍රලාභියකුට දැනුම් දෙනු ලැබීමට නියමිත යම් තීරණයක්, ඒ ඉල්ලුම්කරුගේ හෝ බලපත්‍රලාභියාගේ සාමාන්‍ය ව්‍යාපාරික ස්ථානය හෝ වාසස්ථානය වෙත ලියාපදිංචි තැපෑලෙන් ඒ දැන්වීම යවනු ලැබූ දිනයේ සිට ගණන් ගනු ලබන දින දෙකක කාලයක් ඉකුත්වීමෙන් පසුව, ඔහු වෙත දැනුම් දෙනු ලැබූ ලෙස සල කනු ලැබිය යුතු ය.

අභියාචන.

**11.** (1) 10 වන වගන්තිය යටතේ—

(අ) බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් ; හෝ

(ආ) තම බලපත්‍රය අවලංගු කරමින්

කරන ලද අධ්‍යක්ෂවරයාගේ තීරණයකින් අතෘප්තියට පත්, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරු හෝ බලපත්‍රලාභියා විසින්, ඒ තීරණය ඔහුට දැනුම් දෙනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත ඊට විරුද්ධව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ අභියාචනයක් මත අමාත්‍ය වරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්—

(අ) අභියාචනයට ඉඩ දී, බලපත්‍රයක් ප්‍රදානය කරන ලෙස හෝ අලුත් කරන ලෙස අධ්‍යක්ෂවරයාට විධාන කරනු ලැබිය හැකිය ; නැතහොත්

(ආ) අභියාචනය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් (2) වන උපවගන්තිය යටතේ තමා වෙත නිකුත් කරන ලද යම් විධාන යකට අනුකූලව අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ ඉහතින් වූ විධිවිධාන අතුරෙන් යම් විධිවිධාන යක් යටතේ බලපත්‍රයක් සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ඉල්ලීම සමග වූ ගාස්තුව, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරු හෝ බලපත්‍රලාභියා වෙත අධ්‍යක්ෂවරයා විසින් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂවරයාගේ බලතල.

**12.** (1) (අ) පොහොර නිෂ්පාදනය කරනු ලබන, සකස් කරනු ලබන, ගබඩා කරනු ලබන හෝ බෙදාහරිනු ලබන ස්ථානයක් යයි තමා විශ්වාස කරන යම් ස්ථානය කට යම් යුක්ති සහගත වේලාවකදී ඇතුළුවී, එහි ඇති යම් උපකරණ, ගබඩා පහසුකම්, අමුද්‍රව්‍ය සහ නිමි නිෂ්පාදන පරීක්ෂා කිරීමට ;

(ආ) යම් වාහනයක් නවතා, ඊට ගොඩවී, මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකරනු ලබන්නේ දැයි නිසැකව දැනගැනීමෙහි ලා අවශ්‍ය යම් විමර්ශන එහි දී කිරීමට;

(ඇ) සිය මෙහෙයීමෙන් ම හෝ යම් තැනැත්තකු විසින් ලියවිල්ලකින් කරනු ලබන යම් පැමිණිල්ලක් හෝ ඉල්ලීමක් මත, පොහොර නිෂ්පාදනය කරන, සකස් කරන, ගබඩා කරන හෝ බෙදාහරින යම් ස්ථානයක හෝ යම් වාහනයක තිබී සොයාගත් යම් පොහොර වර්ගයකින් විශ්ලේෂණය කිරීම සඳහා, සැම්පල ගැනීමට සහ මේ පනතේ කාර්ය සඳහා පොහොර විශ්ලේෂණය කරනු පිණිස අධ්‍යක්ෂවරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නිලධරයකු ලවා අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරන ලද යම් රසායනාගාරයක දී නියමිත ආකාරයට ඒ සැම්පල විශ්ලේෂණය කරවීමට;

(ඈ) 15 (1) වන වගන්තියේ විධිවිධාන කඩකරමින් තිබී සොයාගත් බාල කළ පොහොර කිසිවක් තහනමට ගෙන, රඳවා තබා ගැනීමට; සහ

(ඉ) ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කරනු ලැබිය යුතු යම් කාලයක් ඇතුළත මේ පනත යටතේ තම කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා අවශ්‍ය සියළු තොරතුරු තමා වෙත සැපයිය යුතු යයි යම් පොහොර ආනයනකරුවකුට, නිෂ්පාදකයෙකුට, සකස් කරන්නකුට හෝ බෙදා හරින්නෙකුට නියම කිරීමට

අධ්‍යක්ෂවරයාට බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ කාර්යය සඳහා විශ්ලේෂණය පිණිස සැම්පල ගැනීමේ ක්‍රමය, 1982 ශ්‍රී 550, යූ. ඩී. සී. 631. 8 : 620. 113 ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි සඳහන් කර ඇත්තාවූද 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිශ්චය කරන ලද්දාවූ ද පොහොර සැම්පල කිරීමේ ක්‍රමයම වන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ වූ දැන්වීමක් මගින් යම් තොරතුරක් සපයන ලෙස නියම කර ඇති යම් තැනැත්තකු විසින්, වෙනත් යම් නීතියක විධිවිධාන යටතේ ඒ තොරතුරු හෙළි කිරීමෙන් ඒ තැනැත්තා වළක්වනු ලබන අවස්ථාවකදී හැර, දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත ඒ නියමය අනුව ක්‍රියාකිරීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

13. කිසිම තැනැත්තකු විසින්— පොහොර බෙදාහැරීම.

(අ) (i) ඉරී යාමක්, පුපුරා යාමක් හෝ වැරි පැලී යාමක් නොමැතිව, යුක්ති සහගත අන්දමේ එහා මෙහා කිරීමකට ඔරොත්තු දෙන ;

(ii) ඇසුරුමක හෝ භාජනයක අඩංගු දේ භෞතික වශයෙන් දිරාපත් වීම වලක්වා ලන

ඒ ඇසුරුම හෝ භාජනය තුළ බහා හෝ ඒ ඇසුරුමෙන් හෝ භාජනයෙන් හැර ;

(ආ) පහත දැක්වෙන විස්තර, එනම්—

(i) වෙළෙඳ නාම සහ/හෝ නිෂ්පාදකයාගේ හෝ සකස් කරන්නාගේ නාම ;

(ii) ඒ ඇසුරුමේ හෝ භාජනයේ අඩංගු දේවල ශුද්ධ බර ;

(iii) ඒ පොහොරෙහි ඇතුලත් අංගෝපාංග සහ පෝෂ්‍යාදයී ප්‍රතිශතයක පිළිබඳ තොරතුරු

දැක්වෙන ලේබලයක් ඒ ඇසුරුම හෝ භාජනය මත අලවනු ලැබ හෝ මුද්‍රණය කරනු ලැබ ඇත්නම් මිස ;

(ඇ) ඒ ඇතුලත් දේ ඇසුරුමේ හෝ භාජනයේ අලවන ලද ලේබලයේ දක්වා ඇති තොරතුරුවලට අනුකූල වන්නේ නම් මිස ;

(ඈ) නිෂ්පාදකයාගේ හෝ සකස් කරන්නාගේ ලිපිනය පිළිබඳව ඔහු දන්නේ නම් සහ තත් කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද නිලධරයන්ට ඒ තොරතුරු සැපයීමට ඔහුට හැකියාවක් ඇත්නම් මිස ;

(ඉ) ඒ පොහොරවල වර්ගය සහ මිල, ඇසුරුමේ හෝ භාජනයේ අලවන ලද ලේබලය මත ඔහු විසින් සඳහන් කරනු ලබන්නේ නම් මිස ; සහ

(ඊ) පොහොර යහපත් භෞතික තත්ත්වයෙන් යුක්ත වන්නේ නම් මිස

ඒ තැනැත්තා විසින් යම් පොහොර හෝ පොහොර මිශ්‍රනයක් බෙදා හැරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ නොකළ යුතු ය.

14. (1) පොහොර කිසිවක් තම සන්තකයේ තබාගෙන ඇති කිසිම පොහොර බෙදාහරින්නකු විසින් ඒ පොහොර බෙදාහැරීම ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතුය. පොහොර බෙදාහැරීම, ප්‍රතික්ෂේප කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් වූ යම් නඩු පැවරීමකදී—

(අ) ප්‍රශ්නයට අදාළ අවස්ථාවේදී තමා විසින් පොහොර සැහෙන ප්‍රමාණයක් සපයන ලදැයිද, නැතහොත්, ඉල්ලා සිටිනු ලැබූ ප්‍රමාණය සැපයීමට ප්‍රමාණවත් පොහොර ප්‍රමාණයක් තම සන්තකයෙහි නොතිබුණේ යයිද ; නැතහොත්

(ආ) ප්‍රශ්නයට අදාළ අවස්ථාවේදී පොහොර බෙදාහැරීම මේ න්තියේ හෝ වෙනත් යම් නීතියක විධිවිධානවලට පටහැනි විය හැකිව තිබුනේ යයි ද

චූදිතයා විසින් ඔප්පු කරනු ලැබීම ප්‍රමාණවත් විත්ති වාචකයක් වන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්යය සඳහා ප්‍රමාණවත් ප්‍රමාණය යනු කොතරම් ප්‍රමාණයක් ද යන වග නිශ්චය කිරීමේදී බෙදාහරින්නාගේ හෝ ඔහුගේ පවුලේ සාමාජිකයන්ගේ කෘෂිකාර්මික ව්‍යවසායේ පාවිච්චිය සඳහා අවශ්‍ය වන්නා වූ පොහොර ප්‍රමාණය සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

**බාල කළ පොහොර බෙදාහැරීම තහනම් කිරීම.**

15. (1) (අ) බාල කළ පොහොර කිසිවක් බෙදාහැරීම හෝ බෙදාහැරීම සඳහා ඉදිරිපත් කිරීම, කිසිම පොහොර බෙදාහරින්නකු විසින් කරනු නොලැබිය යුතු ය.

(ආ) කිසිම ප්‍රවාහකයකු විසින් තම අනුදැනුම හෝ දැනුම ඇතිව බාල කළ පොහොර ප්‍රවාහනය කරනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා—

(අ) පොහොර යෙදීමට අදහස් කර ඇති යම් පලදාවකට හානිකර වන සැහෙන ප්‍රමාණයකින් යුත් අනතුරුදායක වූ කොටස් ඒ පොහොරෙහි ඇතුලත් වී තිබී නම්; නැතහොත්

(ආ) පොහොරවල සංයුතිය පොහොර අඩංගු වන ඇසුරුමේ හෝ භාජනයේ අලවා ඇති ලේබලයට අනුව එහි තිබිය යුතුයයි කියනු ලබන සංයුතියට වඩා අඩු නම් හෝ එයින් වෙනස් වේ නම්,

ඒ පොහොර බාල කළ පොහොර යයි සලකනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමකදී, මේ පනතේ කාර්යය සඳහා පොහොර විශ්ලේෂණය කරනු පිණිස අධ්‍යක්ෂවරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද නිලධරයකුගේ අත්සන යටතේ නිකුත් කරන ලද්දාවූ ද, වරද සිදු කරන ලදැයි කියනු ලබන්නේ යම් පොහොර සම්බන්ධයෙන් ද, ඒ පොහොරවල කොටස් හෝ එහි සංයුතිය ප්‍රකාශ කෙරෙන්නා වූ සහතිකයක් එහි ඇතුලත් ප්‍රකාශ සම්බන්ධයෙන් මූල් බැල්මට පිළිගත හැකි සාක්ෂි වන්නේ ය.

**බාල කළ පොහොර තහනමට ගැනීම සහ රඳවා තැබීම.**

16. (1) 15(1) වන වගන්තියේ විධිවිධාන කඩකරනු ලැබ ඇතැයි තමා විශ්වාස කරන්නේ බාල කළ පොහොර කිසිවක් මගින් හෝ ඒ සම්බන්ධයෙන්ද, ඒ බාල කළ පොහොර, 5 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් ස්වකීය බලතල පවරා ඇත්තේ යම් නිලධරයකු හෝ සේවකයකු වෙත ද, ඒ නිලධරයා හෝ සේවකයා විසින් අවශ්‍ය වන යම් කාලයක් සඳහා තහනමට ගැනීම සහ රඳවා තැබීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තහනමට ගනු ලැබූ පොහොර කිසිවක්, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ මනාපය අනුව, ඒ පොහොර තහනමට ගනු ලැබූ ගොඩනැගිල්ලේ හෝ ස්ථානයේ තැබීම හෝ ගබඩා කිරීම, නැතහොත්, ඔහුගේ අභිමතය පරිදි, වෙනත් යම් ස්ථානයකට ඉවත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(3) එවැනි යම් නිලධරයකු හෝ සේවකයකු විසින්, මේ පනත යටතේ කරන ලද යම් තහනමට ගැනීමක් පිළිබඳව අධ්‍යක්ෂවරයා වෙත වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය.

**විශ්ලේෂණය.**

17. (1) 16 වන වගන්තිය යටතේ පොහොර තහනමට ගනු ලැබූ නිලධරයා හෝ සේවකයා විසින්, තමා විසින් එසේ තහනමට ගනු ලැබූ පොහොර හෝ එහි යම් කොටසක් හෝ තමා විසින් ගනු ලැබූ යම් සැම්පලයක් හෝ විශ්ලේෂණය හෝ පරීක්ෂා කිරීම සඳහා අනුමත කළ විශ්ලේෂකයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද පොහොර අනුමත කළ විශ්ලේෂකයකු විසින් විශ්ලේෂණයක් හෝ පරීක්ෂා කිරීමක් කර ඇති අවස්ථාවක දී, තම විශ්ලේෂණයේ හෝ පරීක්ෂා කිරීමේ ප්‍රතිඵල දක්වමින්, ඔහු විසින් අධ්‍යක්ෂවරයා වෙත සහතිකයක් හෝ වාර්තාවක්, නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා අනුමත විශ්ලේෂක, (1) වන උපවගන්තියේ සඳහන් විශ්ලේෂණය හෝ පරීක්ෂා කිරීම කර ගෙනයාම පිණිස අධ්‍යක්ෂවරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නිලධරයකු විය යුතු ය.

**ආනයනකරුවන් නිෂ්පාදකයන්, සකස් කරන්නන් හෝ බෙදාහරින්නන් නොවන තැනැත්තන් විසින්, අවශ්‍යතා ඉක්මවා පොහොර සන්තකයේ තබාගැනීම තහනම් කිරීම.**

18. පොහොර ආනයනකරුවකු, නිෂ්පාදකයකු, සකස් කරන්නකු හෝ බෙදා හරින්නකු නොවන කිසිම තැනැත්තකු විසින්, තමාට අයත් වූ හෝ තමා විසින් හෝ තමා වෙනුවෙන් වගා කරනු ලබන්නා වූ ඉඩම්වල එක් වර්ෂයක කාලයකට යොදනු ලැබීම සඳහා වන අවශ්‍යතා ඉක්ම වන්නාවූ යම් පොහොර ප්‍රමාණයක් තම සන්තකයෙහි තබාගනු නොලැබිය යුතු ය.

**පොහොර සකස් කිරීම.**

19. පොහොර සකස් කිරීමෙහි නිරතව සිටින සෑම තැනැත්තකු විසින්ම, ඒ මිශ්‍රණය සංයෝග කිරීම සඳහා අධ්‍යක්ෂවරයාගේ අනුමතය ලියවිල්ලකින් ලබාගත යුතු ය.

**පොහොර විශ්ලේෂණයේ දී අදාළ කළ යුතු ප්‍රමිති.**

20. මේ පනත යටතේ පොහොර විශ්ලේෂණයේ දී අදාළ කළ යුතු ප්‍රමිති, 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිශ්චය කරන ලද ප්‍රමිති විය යුතු අතර, එවැනි ප්‍රමිති නොමැති විටක, එක්සත් රාජධානියේ භාවිතා කරනු ලබන අනුරූපී ප්‍රමිති අදාළ කරගනු ලැබිය යුතු ය.

21. (අ) 2 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් පොහොර කිසිවක් ආනයනය කරන, නිෂ්පාදනය කරන හෝ සකස් කරන ; වැරදි.

(ආ) 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේද යටතේ වූ අධ්‍යක්ෂවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමේදී, ඔහුට අවහිර කරන හෝ බාධා කරන ;

(ඇ) 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ තොරතුරු කිසිවක් සපයන ලෙස නියම කරනු ලැබූ විට, අසත්‍ය බව දන්නා යම් තොරතුරක් සපයන ;

(ඈ) යුක්තිසහගත හේතුවක් නොමැතිව, 12 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියාකිරීම පැහැර හරින ;

(ඉ) 13 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් පොහොර කිසිවක් බෙදාහරින හෝ බෙදාහැරීම සඳහා ඉදිරිපත් කරන ;

(ඊ) 14 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් පොහොර බෙදාහරින්නකු වශයෙන් තම සන්තකයෙහි ඇති පොහොර කිසිවක් බෙදාහැරීම ප්‍රතික්ෂේප කරන ;

(උ) 15 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන කඩකරමින් බාල කළ පොහොර කිසිවක් බෙදාහරින හෝ බෙදාහැරීම සඳහා ඉදිරිපත් කරන ;

(ඌ) 15 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන කඩකරමින් බාල කළ පොහොර ප්‍රවාහනය කරන ;

(එ) 16 වන වගන්තිය යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා යම් නිලධරයකුට හෝ සේවකයකුට අවහිර කරන හෝ බාධා කරන ;

(ඒ) 18 වන වගන්තියේ විධිවිධාන කඩකරමින්, පොහොර ආනයනකරුවකු, නිෂ්පාදකයකු සකස් කරන්නකු හෝ බෙදා හරින්නකු නොවී, තම අවශ්‍යතාව ඉක්මවන යම් පොහොර ප්‍රමාණයක් තම සන්තකයෙහි තබා ගනු ලබන ;

(ඔ) 19 වන වගන්තියේ සඳහන් කර ඇති අනුමතය නොලබා පොහොර කිසිවක් සකස් කරන ; හෝ

(ඕ) මේ පනත යටතේ සාදන ලද නියෝග කිසිවක් අනුව ක්‍රියාකිරීම පැහැර හරින,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

22. මේ පනත යටතේ වරදකට වරදකරුවකු වන සෑම තැනැත්තකුම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහස් පන්සියයකට නොඅඩු වූ ද රුපියල් පන්දහසකට නොවැඩි වූ ද දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ යටත් විය යුතු ය; තවද, දෙවන හෝ තදනන්තර වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් පන්දහසකට නොඅඩු වූ ද, රුපියල් දස දහසකට නොවැඩි වූද, දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය. — දණ්ඩන.

23. 21 වන වගන්තියේ (උ) ඡේදය හෝ (ඌ) ඡේදය යටතේ යම් තැනැත්තකු වරදකට වරදකරු කරනු ලබන අධිකරණය විසින්, 22 වන වගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි යම් දඬුවමකට අතිරේකව, වරද සිදු කරන ලද්දේ යම් බාල කළ පොහොර සම්බන්ධයෙන්ද, ඒ බාල කළ පොහොර රාජ්‍ය සන්තක කරන ලෙස ආඥා කරනු ලැබිය හැකි ය. — රාජ්‍ය සන්තක කිරීම ආඥා කිරීමට අධිකරණය සතු බලය.

24. (1) 23 වන වගන්තිය යටතේ රාජ්‍යසන්තක කරන ලද බාල කළ පොහොර කිසිවක්, එසේ රාජ්‍ය සන්තක කරනු ලැබූ විට, පරම වශයෙන්ම රජය සතු විය යුතු ය. ඒ සතුවීම— — රාජ්‍ය සන්තක කරන ලද පොහොර බැහැර කිරීම.

(අ) රාජ්‍යසන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි කාල සීමාව ඉකුත්වීමෙන් පසුව; හෝ

(ආ) රාජ්‍ය සන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, රාජ්‍යසන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින් හෝ පිළිගනිමින් ඒ අභියාචනය තීරණය කරනු ලැබූ විට

බලාත්මක විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රාජ්‍යසන්තක කරන ලද පොහොර කිසිවක සන්තකය අධ්‍යක්ෂවරයා විසින් භාරගනු ලැබිය යුතු අතර ඒ පොහොර සුදුසු යයි ඔහු කල්පනා කරන පරිද්දෙන් බැහැර කරනු ලැබිය හැකි ය.

25. මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග කිසිවක් යටතේ වරදක් සම්බන්ධයෙන් වූ නඩු පැවරීමක්, අධ්‍යක්ෂවරයාගේ ලිඛිත අනුමතය මගින් හෝ ලිඛිත අනුමතය ඇතිව හැර, කරනු නොලැබිය යුතු ය. — නඩු කටයුතු පැවරීම.

26. මේ පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝග කිසිවක් යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක— — පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි. දණ්ඩන.

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකුව හෝ නිලධරයකුව සිටි සෑම තැනැත්තකුම; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය, සංස්ථාවක් නොවන වෙනත් මණ්ඩලයක් නම්, වරද සිදු කරනු ලැබූ අවස්ථාවේදී ඒ මණ්ඩලයේ සාමාජිකයකුව සිටි සෑම තැනැත්තකුම

ඒ වරදට වරදකරු විය යුතු ය:

එසේ වුවද, වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව බව නැතහොත් ස්වකීය කාර්තව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන අවස්ථාවෝචිත පරිදි ඒ වරද සිදුකිරීම වැළැක්වීමෙහිලා ඔහු විසින් ක්‍රියා කළ යුතු වූ පරිදි සියලු උදෙක්ගයෙන් ක්‍රියා කළ බව ඒ අධ්‍යක්ෂකවරයා, නිලධරයා, හෝ සාමාජිකයා විසින් ඔප්පු කරනු ලැබුවහොත්, ඔහු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

සද්භාවයෙන් කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**27.** මේ පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝග කිසිවක් යටතේ යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද්දේ යයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම සිවිල් නඩුවක්, අපරාධ නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

නියෝග.

**28.** (1) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත හෝ මේ පනත යටතේ නියෝග සෑදිය යුතු යයි නියමිත හෝ බලය දෙන ලද සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය පළ කරනු ලැබූ දිනයෙහි දී හෝ එහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක දී හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පමණු ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කර ඇතැයි සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපනය.

**29.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ—

"බෙදාහැරීම" යන්නට විකිණීම ඇතුළත් වන අතර, එහි ව්‍යාකරණානුකූල ප්‍රභේද හා සජාතීය යෙදුම් ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය;

"පොහොර" යන්නෙන්, පිළිගත් ශාක පෝෂක එකක් හෝ වැඩි ගණනක් ඇතුළත් වන්නාවූ ද, ශාක පෝෂක තිබීම හේතුකොට ගෙන භාවිත කරනු ලබන්නාවූ ද, ශාක වැඩීම

ප්‍රවර්ධනයෙහි ලා භාවිතා කිරීම පිණිස අරමුණු කරනු ලබන නැතහොත් ඒ සඳහා අගයක් ඇතැයි කියනු ලබන යම් ද්‍රව්‍යයක් අදහස් වන අතර, පිරියම් නොකළ සත්ව හෝ ශාකමය පොහොර ඊට ඇතුළත් නොවේ;

"සකස් කිරීම" යන්න පොහොර සම්බන්ධයෙන් යෙදෙන විට, පොහොරවල විවිධ කොටස් පිළිබඳ යම් කලවම් කිරීමක් හෝ මිශ්‍රණයක් ඉන් අදහස් වේ; තවද.

"සකස් කරන්නා" යන්නෙන්, පොහොර සකස් කිරීමෙහි ලා නිරතව සිටින යම් තැනැත්තෙකු අදහස් වේ.

## උපලේඛනය

### 2 (2) වන වගන්තිය

#### පොහොර ආනයනය සඳහා වූ බලපත්‍රයේ නියම හා කොන්දේසි

1. බලපත්‍රය වෙනත් යම් තැනැත්තකුට පවරනු නොලැබිය යුතු අතර, බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු වෙතද ඒ තැනැත්තා නොවන වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය සඳහා එය පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

2. සෑම බලපත්‍රලාභියකු විසින් ම, මේ පනත යටතේ තමා වෙත නිකුත් කරන ලද බලපත්‍රය, තම ව්‍යාපාරික ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

3. බලපත්‍රලාභියා විසින් ප්‍රමාණවත් ගුදම් පහසුකම් සහ ගබඩා ඉඩකඩ ඇති බවට සාධක සපයනු ලැබිය යුතු ය.

4. බලපත්‍රලාභියා විසින්, අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමතය නොමැතිව, බලපත්‍රය මගින් ආවරණය වූ ව්‍යාපාරයේ යම් සම්බන්ධතාවක් විකිණීම, පැවරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ ඒ ව්‍යාපාරයේ ජීවිකාර අයිතියක් වෙනත් යම් තැනැත්තකු විසින් සතු කරගනු ලබන ඒ ව්‍යාපාරය පිළිබඳ වූ යම් එකඟවීමකට ඒ වෙනත් තැනැත්තා සමග ඇතුළත්වීම කරනු නොලැබිය යුතුය.

5. බලපත්‍රය නැතිවූ විටක, සමාදාන විනිශ්චයකාරවරයකු විසින් සහතික කරන ලද, නැතිවීම ස්ථිර කරන දිවුරුම් පත්‍රයක් බලපත්‍රලාභියා විසින් ඉදිරිපත් කරනු ලැබ, නියමිත බලපත්‍ර ගාස්තුවෙන් අඩක් ගෙවූ විට, අධ්‍යක්ෂවරයා විසින් එහි සහතික පිටපතක් නිකුත් කරනු ලැබිය යුතු ය.

6. බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ද, ඒ ව්‍යාපාරය කරගෙන යාම නතර කරන්නා වූ හෝ තම ව්‍යාපාරික ස්ථානය වෙනස් කරන්නා වූ සෑම බලපත්‍රලාභියකු විසින් ම, ඒ බව, අධ්‍යක්ෂවරයා වෙත වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය.

7. යම් පුද්ගලයකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයක්, බලපත්‍රලාභියාගේ මරණයෙන් පසු අවලංගු විය යුතු ය.

8. සංස්ථාවක් වෙත නිකුත් කරන ලද බලපත්‍රයක්, ඒ සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට අවලංගු විය යුතුය.

9. මේ බලපත්‍රයට අදාළ සියලු දැන්වීම්, තත්කාලයේ ව්‍යාපාරික ස්ථානය භාර තැනැත්තා වෙත තැපැල් මගින් යවනු ලැබුවහොත් හෝ භාරදෙනු ලැබුව හොත් හෝ ඒ ස්ථානයේ දොරේ හෝ ගේට්ටුවේ අලවනු ලැබුවහොත්, ඒ දැන්වීම් බලපත්‍රලාභියා වෙත යථා පරිදි භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

10. බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ඉල්ලීමෙහි දක්වා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි බව සොයා ගනු ලැබුවේ නම්, බලපත්‍රය අවලංගු කරනු ලැබීමට යටත් විය යුතු ය.

### පොහොර නිෂ්පාදනය සඳහා වූ බලපත්‍රයේ නියම සහ කොන්දේසි

1. බලපත්‍රය වෙනත් යම් තැනැත්තකුට පවරනු නොලැබිය යුතු අතර, බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු වෙතද ඒ තැනැත්තා නොවන වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය සඳහා එය පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

2. සෑම බලපත්‍රලාභියකු විසින් ම, මේ පනත යටතේ තමා වෙත නිකුත් කරන ලද බලපත්‍රය, තම ව්‍යාපාරික ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

3. බලපත්‍රලාභියා විසින්, අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමතය නොමැතිව, බලපත්‍රය මඟින් ආවරණය වූ ව්‍යාපාරයේ යම් සම්බන්ධතාවක් විකිණීම, පැවරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ ව්‍යාපාරයේ හිමිකාර අයිතියක් වෙනත් යම් තැනැත්තකු විසින් සතු කරගනු ලබන, ඒ ව්‍යාපාරය පිළිබඳ වූ යම් එකඟවීමකට ඒ වෙනත් තැනැත්තා සමඟ ඇතුළත් වීම කරනු නොලැබිය යුතු ය.

4. බලපත්‍රය නැතිවූ විටක, සමාදාන විනිශ්චයකාරවරයකු විසින් සහතික කරන ලද, නැතිවීම ස්ථිර කරන දිවුරුම් පත්‍රයක් බලපත්‍රලාභියා විසින් ඉදිරිපත් කරනු ලැබ, නියමිත බලපත්‍ර ගාස්තුවෙන් අඩක් ගෙවූ විට, අධ්‍යක්ෂවරයා විසින් එහි සහතික පිටපතක් නිකුත් කරනු ලැබිය යුතු ය.

5. බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ද, ඒ ව්‍යාපාරය කරගෙන යාම නතර කරන්නා වූ හෝ තම ව්‍යාපාරික ස්ථානය වෙනස් කරන්නා වූ සෑම බලපත්‍රලාභියකු විසින් ම, ඒ බව, අධ්‍යක්ෂවරයා වෙත වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය.

6. යම් පුද්ගලයකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයක්, බලපත්‍රලාභියාගේ මරණයෙන් පසු අවලංගු විය යුතු ය.

7. සංස්ථාවක් වෙත නිකුත් කරන ලද බලපත්‍රයක්, ඒ සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට අවලංගු විය යුතු ය.

8. පොහොර නිෂ්පාදනය කරනු ලබන්නේ යම් ස්ථානයක ද ඒ ස්ථානයේ විස්තර බලපත්‍රලාභියා විසින් සපයනු ලැබිය යුතු ය.

9. බලපත්‍රයේ සඳහන් ස්ථානයේ හෝ ස්ථානවල පමණක් බලපත්‍රලාභියා විසින් නිෂ්පාදන කටයුතු කරගෙන යා යුතු ය.

10. මේ බලපත්‍රයට අදාළ සියලු දැන්වීම්, තත්කාලයේ ව්‍යාපාරික ස්ථානය භාර තැනැත්තා වෙත තැපැල් මඟින් යවනු ලැබුවහොත් හෝ භාරදෙනු ලැබුවහොත් හෝ ඒ ස්ථානයේ දොරේ හෝ ගේට්ටුවේ අලවනු ලැබුවහොත්, ඒ දැන්වීම් බලපත්‍රලාභියා වෙත යථා පරිදි භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

11. බලපත්‍රය ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමෙහි දක්වා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි බව සොයා ගනු ලැබුවේ නම්, බලපත්‍රය අවලංගු කරනු ලැබීමට යටත් විය යුතු ය.

### පොහොර සකස් කිරීම සඳහා වූ බලපත්‍රයේ නියම සහ කොන්දේසි

1. බලපත්‍රය වෙනත් යම් තැනැත්තකුට පවරනු නොලැබිය යුතු අතර, බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු වෙතද ඒ තැනැත්තා නොවන වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය සඳහා එය පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

2. සෑම බලපත්‍රලාභියකු විසින් ම, මේ පනත යටතේ තමා වෙත නිකුත් කරන ලද බලපත්‍රය, තම ව්‍යාපාරික ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

3. බලපත්‍රලාභියා විසින්, අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමතය නොමැතිව, බල පත්‍රය මගින් ආවරණය වූ ව්‍යාපාරයේ යම් සම්බන්ධතාවක් විකිණීම, පැවරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ ඒ ව්‍යාපාරයේ ජීවිකාර අයිතියක් වෙනත් යම් තැනැත්තකු විසින් සතු කරගනු ලබන, ඒ ව්‍යාපාරය පිළිබඳ වූ යම් එකඟවීමකට ඒ වෙනත් තැනැත්තා සමග ඇතුළත් වීම කරනු නොලැබිය යුතු ය.

4. බලපත්‍රය නැතිවූ විටක, සමාදාන විනිශ්චයකාරවරයකු විසින් සහතික කරන ලද, නැතිවීම ස්ථිර කරන දිවුරුම් පත්‍රයක් බලපත්‍රලාභියා විසින් ඉදිරිපත් කරනු ලැබ, නියමිත බලපත්‍ර ගාස්තුවෙන් අඩක් ගෙවූ විට අධ්‍යක්ෂවරයා විසින් එහි සහතික පිටපතක් නිකුත් කරනු ලැබිය යුතු ය.

5. බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ද, ඒ ව්‍යාපාරය කරගෙන යාම නතර කරන්නා වූ හෝ තම ව්‍යාපාරික ස්ථානය වෙනස් කරන්නා වූ හැම බලපත්‍රලාභියකු විසින් ම, ඒ බව අධ්‍යක්ෂවරයා වෙත වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය.

6. යම් පුද්ගලයකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයක්, බලපත්‍රලාභියාගේ මරණයෙන් පසු අවලංගු විය යුතු ය.

7. සංස්ථාවක් වෙත නිකුත් කරන ලද බලපත්‍රයක්, ඒ සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට අවලංගු විය යුතු ය.

8. පොහොර සකස් කරනු ලබන්නේ යම් ස්ථානයක ද ඒ ස්ථානයේ විස්තර බලපත්‍රලාභියා විසින් සපයනු ලැබිය යුතු ය.

9. බලපත්‍රයේ සඳහන් ස්ථානයේ හෝ ස්ථානවල පමණක් බලපත්‍රලාභියා විසින් පොහොර සකස් කරනු ලැබිය යුතු ය.

10. මේ බලපත්‍රයට අදාළ සියලු දැන්වීම්, තත්කාලයේ ව්‍යාපාරික ස්ථානය භාර තැනැත්තා වෙත තැපැල් මගින් යවනු ලැබුවහොත් හෝ භාරදෙනු ලැබුව හොත් හෝ ඒ ස්ථානයේ දොරේ හෝ ගේට්ටුවේ අලවනු ලැබුවහොත්, ඒ දැන්වීම් බලපත්‍රලාභියා වෙත යථා පරිදි භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

11. බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ඉල්ලීමෙහි දක්වා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි බව සොයා ගනු ලැබුවේ නම්, බලපත්‍රය අවලංගු කරනු ලැබීමට යටත් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.